# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

## අභියාචනා අංක:- AAT/11/2026 (NPC)

යූ.ඒ.විතාරණ
**අභියාචක**

**එදිරිව,**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

දිනය : 2026.03.03

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-නියෝගය-**

දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු. යූ.ඒ.විතාරණ යන අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2026.01.08 දිනැති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු සේවයේ නොසිටි දින 15ක කාලපරිච්ඡේදය වැටුප් සහිත කාලයක් සේ සළකන ලෙසයි. අභියාචක 2021.08.17 දින සිට සති දෙකක කාලපරිච්ඡේදයක් සේවයට නොපැමිණීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා වන වැටුප අහිමි කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2025.11.17 දිනැති තීරණයෙහි V වන ඡේදයේ සඳහන් කර ඇත්තේ, නිළධාරියා 2021.08.18 දින සිට දින හතක් සඳහා පෞද්ගලික වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ලබාගත් වෛද්‍ය නිර්දේශයක පිටපතක් මඟින් ඉල්ලීම යොමු කර ඇතත්, නිවාඩු

නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා වෛද්‍ය වාර්තාවේ මුල් පිටපත සමඟ පොදු 125 පෝරමය අත්සන් කර, විධිමත්ව ඉදිරිපත් කර නොමැති වීම නිසා, ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවයි.

සාමාන්‍යයෙන් පොදු 125 මඟින් ඉල්ලීම් කරනු ලබන්නේ, නිවාඩු යාමට පෙර නිවාඩු අනුමත කර ගැනීම සඳහාය. මෙම තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති 2021.08.18 දිනැති, වෛද්‍ය එල්.ආර්.ඒ. ශාලික යන අය විසින් නිකුත් කර ඇති වෛද්‍ය සහතිකයේ ඡායාපිටපතක් අභියාචක විසින් අභියාචනා පෙත්සම සමඟ ඉදිරිපත් කර ඇත. එහි සඳහන් වන්නේ, 2021.08.18 දින සිට 2021.08.25 දින දක්වා නිවාඩු නිර්දේශ කරන බවයි. තවද, අභියාචකගේ ශ්වසන ආබාධයක් නිසා ඔහුට ප්‍රතිකාර කළ බවටත් එහි වැඩිදුරටත් සඳහන් වේ.

මේ අවස්ථාවේදී අභියාචක විසින්, ඇමුණුම 05 ලෙසට අභියාචනා පෙත්සම සමඟ ඉදිරිපත් කර ඇති රෝග විනිශ්චය පතටද, විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. එම වාර්තාව අනුව පැහැදිළි වන්නේ, අභියාචක කොවිඩ්19 රෝගය වැළඳීම හේතුවෙන්, කොවිඩ් රෝගීන් ප්‍රතිකාර ලැබූ මධ්‍යස්ථානයක 2021.05.12 දින සිට 2021.05.31 දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලැබූ බවයි. මෙහිදී පැහැදිළි වන්නේ, අභියාචකට කොවිඩ් රෝගය වැළඳී තිබූ බවයි. ඒ අනුව පැහැදිළි වන්නේ අභියාචක විසින් ඉදිරිපත් කරන ලද ඉහතින් සඳහන් 2021.08.18 දිනැති වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු සත්‍ය වන බවයි. ඒ හැරෙන්නට අභියාචක විසින් ගාල්ල සමුපකාර රෝහලේ වෛද්‍ය නිළධාරී විසින් නිකුත් කර ඇති 2021.09.02 දිනැති වෛද්‍ය වාර්තාවක්ද ඉදිරිපත් කර ඇත. එහි සඳහන් වන්නේ අභියාචක කොවිඩ් වැළඳීමෙන් පසු ඇති වූ ආබාධයන් සඳහා ප්‍රතිකාර ලබා ඇති බවයි.

ඉහත කරුණු අනුව පැහැදිළිව පෙනී යන්නේ, අභියාචක සේවයට වාර්තා නොකර ඇත්තේ, කොවිඩ් රෝගය වැළඳීමෙන් අනතුරුව ඇති වන ආබාධයන්ට ඔහු ලක් වී ඇති හේතුව නිසා බවයි. අභියාචක මේ අවස්ථාවේදී දන්වා සිටින්නේ, ඔහු සේවයට වාර්තා නොකළත්, ඔහු විසින් ඒ සඳහා නියමිත ආකාරයෙන් පොත්පත්වල සටහන් තැබූ බවයි. ඉහත කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ,

අභියාචක සේවයට වාර්තා නොකිරීමට හේතුව වී ඇත්තේ, ඔහු රෝගී තත්ත්වයකින් පසුවී සිටි නිසා බවයි. ඒ බව සනාථ කිරීම සඳහා අවශ්‍ය වෛද්‍ය වාර්තාද ඉදිරිපත් කර ඇත.

ඉහත හේතූන් සළකා බලා අභියාචක වෙත නිකුත් කර ඇති දඬුවම වන, ඔහු සේවයේ නොසිටි කාලය වැටුප් රහිත සේවා කාලයක් සේ සැළකීම, යන දඬුවම ඉවත් කිරීමට තීරණය කරමු. ඒ අනුව ඔහුට එම කාලපරිච්ඡේදය සඳහා එනම්, 2021.08.18 දින සිට දින 14ක කාලපරිච්ඡේදය සඳහා හිමි විය යුතු වැටුප් ගෙවන ලෙසටද තවදුරටත් නියෝග කරමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකී කාලපරිච්ඡේදය ඔහුගේ සක්‍රීය සේවා කාලපරිච්ඡේදයේම කොටසක් ලෙසට ගැනිය යුතු බවටද තවදුරටත් තීරණය කරමු. ඉහත හේතූන් සළකා බලා අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/